
(ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ ඉරුදින නව දහම් පාසල් පොදු
පාඨමාලාවට අනුව සකසන ලද පාඩම් සඳහා ක්‍රියාකාරකම්)

# 9 වන ශ්‍රේණිය



සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය,

කොළඹ දියෝකීසිය



9 වෙනි ශ්‍රේණිය - 1 වන පාඩම

# දෙවියන් වහන්සේ මත රදා සිටීම

## බයිබල් කොටස - හිතෝපදේශය 16:1-9 ,ශු.ජොහාන් 15: 1-10

**කටපාඩම් පදය:** "ඔබේ ක්‍රියාවලිය සමිඳුන් හට කැපකරන්න. එවිට ඔබේ අරමුණු ඉටු වනු ඇත."

(හිතෝපදේශ 16:3)

1. "ඔබ මා හා ඒකාබද්ධ නොවන්නෙහු නම් ඵල දැරීමට ඔබට නොහැකිය." ජේසුස් වහන්සේ උන් වහන්සේ හා සමඟ ඒකාබද්ධව ඵල දැරීමට අපට ආරාධනා කරයි. ඔබ උන්වහන්සේගේ ආරාධනාව පිළිගැනීමට සූදානම් වන්නේ කෙසේ ද? පැහැදිලි කරන්න.

   ..............................................................................................................................

   ..............................................................................................................................

2. ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතය හා සම්බන්ධව ඵල දරන කිතුනුවකුගේ ලක්ෂණ විය යුත්තේ කුමක්දැයි ලියන්න.

   ..............................................................................................................................

   ..............................................................................................................................

3. "ඵල නොදරන සියලු අතු කපා හරිනු ඇත." ඔබගේ ජීවිතයේ කපා හැරිය යුතු ඵලනොදරන ලක්ෂණ මොනවාදැයි ලියන්න.

   ..............................................................................................................................

   ..............................................................................................................................

4. එම ලක්ෂණ ඔබගේ ජීවිතයෙන් ඉවත් කිරීමට ඔබ ගත් හෝ ගැනීමට සිටින පියවරයන් මොනවාදැයි පෙළගස්වන්න.

   ..............................................................................................................................

   ..............................................................................................................................

- මෙම කොරෝනා වසංගත කාලයේදි මිනිසුන් තුළින් මතු වු මනුෂ්‍ය ගුණාංග උදාහරණයක් සහිතව පැහැදිලි කරන්න.

  ..............................................................................................................................

  ..............................................................................................................................

❖ **අපගේ කිතුනු ගුණාංග වැඩි වර්ධනය කරගැනීමටත්, කිතුනු දරුවෙක් ලෙස ක්‍රිස්තුස් වහන්සේ තුළ රැදි සිටීමට හැකිවන ලෙස ඉල්ලා දෙවිපියාණන්ට යාච්ඤා කරන්න**

සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය




**9 වෙනි ශ්‍රේණිය - 2 වෙනි පාඩම**

# දෙවියන් වහන්සේ තුළ අභියෝග වලට මුහුණ දෙමු

## බයිබල් කොටස - දානියෙල් 3: 8-30

කටපාඩම් පදය:**"රජතුමෙනි, ඇවිලෙන ගිනි උදුනෙන් අප ගලවා ගන්නට පුළුවන් දෙවි කෙනෙක් සිටිත්නම් ඒ අප වැඳුම්, පිදුම් කරන දෙවියන් වහන්සේමය."**

(දානියෙල් 3: 17)

1. කුමක් සිදුවුව ද, දානියෙල් සහ ඔහුගේ මිතුරන් දෙවියන් වහන්සේ විශ්වාස කිරීමට සහ කීකරු වීමට තීරණය කළේය. එම තීරණය නිසා ඔවුන්ට සිදු වුයේ කුමක් ද? කෙටියෙන් පැහැදිලි කරන්න.

   ..............................................................................................
   ..............................................................................................
   ..............................................................................................

2. විශ්වාසවන්තව සිටීම ගැන දෙවියන් වහන්සේ ඔවුන්ට ආශිර්වාද කළේ කෙසේ ද?

   ..............................................................................................

3. 'රන් රූපයට නමස්කාර කරන්න' යන රජුගේ ඉල්ලීමට ඔවුන් කීකරු නොවුයේ ඇයි?

   ..............................................................................................

4. අපට යම් අවස්ථාවක් උදා වුවහොත්, අප නමස්කාර කරන්නේ එකම වු දෙවියන් වහන්සේට පමණක් බව සැගවීමට උත්සහ කළයුතු ද? ඔබ එවන් අවස්ථාවකට මුහුණපෑවොත් ක්‍රියා කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

   ..............................................................................................
   ..............................................................................................

5. ඔබේ දෙමාපියන් ඔබ ළඟ නොසිටින මොහොතක වුවද නිවැරදි දේ කිරීමටත් ඔවුන්ට විශ්වාසව සිටීමට ත් ඔබට හැකියාව තිබේ ද? ඔබගේ අත්දැකීමක් උදාහරණයක් ලෙස ගෙන පැහැදිලි කරන්න.

   ..............................................................................................
   ..............................................................................................

   - කොරෝනා වැනි වසංගතත් ගංවතුර,නායයෑම් වැනි උවදුරු හමුවේත් අපි අපගේ දේව විශ්වාසය රදවා තබා ගැනීමට කුමක් කළ යුතු ද?

     ..............................................................................................
     ..............................................................................................

❖ **අභියෝග හමුවේ නොසැලි දෙවියන් වහන්සේට විශ්වාසවන්තව සිටීමට උපකාර ඉල්ලා යාච්ඤා කරන්න.**

සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය



## 9 වෙනි ශ්‍රේණිය - 3 වෙනි පාඩම


# කැඳවන්නාවූ දෙවියන් වහන්සේ විශ්වාසවන්ත වන සේක.

**බයිබල් කොටස - උත්පත්ති 12:1-5 ; 26: 2-5**

**කටපාඩම් පදය: "මම නුඹ මගින් විශාල ජාතියක් ඇති කරන්නෙමි, මම නුඹට ආශිර්වාද කරන්නෙමි, නුඹේ නාමය ආසිරි පැතීමේ නාමයක් වන සේ කීර්තියට පමුණුවන්නෙමි."**

**(උත්පත්ති 12: 2)**

- උත්පත්ති 12:1-5 දක්වා බයිබල් කොටස කියවා පිළිතුරු ලියන්න




**හරහට**

ආබ්‍රම් ට වයස අවුරුදු (9).......... වූ කල (10 ) ............... ඔහුට වදාළ ලෙසට ඔහු (11).......... දේශයෙන් පිටත් විය. මෙසේ ආබ්‍රම් සිය බිරිඳ වන (12)........... තම සොහොයුරාගේ පුත් වන (13).......... ද හාරාන් දේශයෙන් රැස්කර ගත් සියලු සම්පත් හා දැසි දසුන් ද රැගෙන (14) ........... දේශය බලා නික්ම ගොස් එහි සැපත් විය.

**පහළට**

සමිඳාණන් වහන්සේ (1).......... ට කතා කළේය. නුඹේ (2)......... ,නෑදෑයන් ද නුඹේ (3)......... ගේ ගෘහය ද අත්හැර දමා මා පෙන්වන්නට යන (4)........... ට යන්න. නුඹ මගින් විශාල (5)......... ඇති කරන්නෙමි.

මම නුඹට (6)..........කරන්නෙමි. නුඹේ (7)..........ආසිරි පැතීමේ නාමයක් වන සේ (8)........... පමුණුවන්නෙමි.

- **දෙවියන් වහන්සේට ඔබගේ ජීවිතය පිළිබඳ සැලැස්මක් ඇතැයි සිතන්න. කුමන මොහොතක හෝ උන්වහන්සේගෙන් ඔබට කැඳවීමක් ලැබුණොත් එය පිළිගැනීමට ඔබ සූදානම් වන්නේ කෙසේ ද?**

.......................................................................................................................................................

❖ දේව පණත් සුරැකීමටත් දෙවියන් වහන්සේට කීකරු වීමටත් හැකි වන ලෙස ඉල්ලා යාච්ඤා කරන්න.

9 වෙනි ශ්‍රේණිය - 4 වෙනි පාඩම



# දෙවියන් වහන්සේ තුළ තෘප්තිමත් අත්දැකීම

**බයිබල් කොටස - උත්පත්ති 40: 1-23; 41: 37-49, හබකුක් 3: 17-19**

**කටපාඩම් පදය: "තවද දෙවියන් වහන්සේගේ අදහස ලෙස කැඳවනු ලැබුවන්ට, එනම් , උන් වහන්සේට ප්‍රේම" කරන අයට, සියල්ලේ දී උන් වහන්සේ ඔවුන්ගේ යහපත පිණිස ක්‍රියා කරන බව අපි දනිමි."(රෝම 8:28)**

**උත්පත්ති 40: 1-23 , 41 ; 37- 49 කියවීමෙන් පහත ප්‍රශ්න වලට පිළිතුරු ලිවීමට උපකාරයක් ගත හැකිය.**



1. ජෝශෙප් .................. ගේ පුත්‍රයා ය.
2. ජෝශෙප් ට තිබු සුවිශේෂ හැකියාව වූයේ ..................... ට හැකි වීමයි.
3. ජෝශෙප් සමග සිරගතව සිට පාරාවෝ විසින් නැවත තනතුරු පිහිටවනු ලැබුවේ, පාරාවෝගේ .............................. ය.
4. රජුගේ සිහින තෝරා දුන් නිසා ජෝශෙප් ට මිසරයේ ............... යන තනතුර ලැබිණි.
5. ජෝශෙප් ට ලැබුණු ගෞරව නාමය ..................

❖ ජෝශෙප් ජීවිතයේ බොහෝ කාලයක් වේදනා තුළින් ගමන් කර තම හැකියාවන් භාවිතා කිරීම නිසා බොහෝ දෙනෙක්ට යහපත සලසමින් ජීවිතය ජය ගැනීමට හැකි විය. එම නිසා ඔහුට තම පියා හා සහෝදරයන් මුහුණ පා තිබු දුෂ්කරතාවයන්ගෙන් ගළවා ගැනීමට හැකි විය.

- ඔබගේ ජීවිතයේ ජය ගැනීමට ඇති දුෂ්කරතා මොනවා ද?

  ..........................................................................................................

- දුෂ්කරතා ජය ගෙන ඔබගේ පවුලට ඔබ උපකාර කිරීමට අදහස් කර සිටින්නේ කෙසේ ද?

  ..........................................................................................................

- විවිධ රෝගාබාධ, ආර්ථික දුෂ්කරතා හේතුවෙන් පීඩාවට පත්ව ඇති සමාජයට, පවුලට ඔබගෙන් දරුවෙකු සහ අනාගතයේ වගතිව යුතු පුරවැසියකු ලෙස යම් සහනයක් ලබා දෙන්නෙ කෙසේ ද? **වර්තමාන ලෝකයේ තත්වය අනුව පිළිතුරු ලියන්න.**

  උදාහරණ- රටේ දියවැඩියා රෝගය වැඩි වන නිසා ටොෆි භාවිතය අඩු කිරීම.

  ..........................................................................................................

- ඔබට ඇති විශේෂ හැකියාව කුමක් ද?.................................................................

සිතා බලන්න-

දුෂ්කරතා මධ්‍යයේ වුව ද, ඔබට කිසි ප්‍රතිලාභයක් නොලැබුන ද, ඔබගේ හැකියාවන් අන් අයගේ යහපත වෙනුවෙන් වැය කිරීමට ඔබ සුදානම් ද?

**ඔබට ලැබුණු හැකියාවන් අන් අය වෙනුවෙන් භාවිතා කිරීමටත් සමාජයේ යහපත වෙනුවෙන් ජීවත් වීමටත් හැකියාව ලබා දෙන ලෙස ඉල්ලමින් යාච්ඤා කරන්න.**

**සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය**

**9 වෙනි ශ්‍රේණිය - 05 වෙනි පාඩම**

# සාමූහිකව දෙවියන් වහන්සේ අත් දැකීම



## බයිබල් කොටස - නික්මයාම 18: 13-27

කටපාඩම් පදය: **"මම පැළ කෙළෙමි, අපොල්ලොස් වතුර දැම්මේය. එහෙත් එහි වැඩීම සැලසුයේ දෙවියන් වහන්සේ ය. වැදගත් වන්නේ පැළ කළ තැනැත්තාවත් නොව, වැඩීම සැලසු දෙවියන් දෙවියන් වහන්සේ ය."**

(1 කොරින්ති 3: 6,7)

- මෝසස් තෝරා පත් කළ කණ්ඩායම් නායකයන් සතුව පැවති ගුණාංග මොනවා ද?

  ..................................................................................................................

  ..................................................................................................................

  ..................................................................................................................

- ඔබගේ අදහස අනුව සැබෑ නායකයෙකුගේ ලක්ෂණ විය යුත්තේ මොනවා ද?

  ..................................................................................................................

  ..................................................................................................................

  ..................................................................................................................

- නිවසේ දි, පාසලේ දි, මිතුරන් සමග සාමූහික (කණ්ඩායම්) ක්‍රියාකාරකම් මගින් ඔබ ලැබූ අත්දැකීම් සඳහන් කරන්න.

  ..................................................................................................................

  ..................................................................................................................

  ..................................................................................................................

- සාමූහික ක්‍රියාකාරකම් මගින් ඔබ ඉගෙන ගත් විශේෂ පාඩම කුමක් ද?

  ..................................................................................................................

  ..................................................................................................................

සිතන්නට යමක්

ඔබට යම් නායකත්වයක් ලැබුණොත් කණ්ඩායමේ සෙසු සාමාජිකයන්ගේ අදහස් වලට ගරුකරමින් සහයෝගයෙන් ක්‍රියා කිරීමට, ඔබට හැකිවේවි ද?

නායකත්වය අවශ්‍ය සෑම මොහොතක දී ම ඒ සඳහා ඉදිරිපත් වන්නටත් අන් අයගේ අදහස් වලට ගරු කරමින් සහයෝගයෙන් කටයුතු කිරීමට හැකියාව ලබා දෙන ලෙස ඉල්ලමින් යාච්ඤා කරන්න.

සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය

9 වන ශ්‍රේණිය - 6 වෙනි පාඩම

# යුක්තියේ හඬ අවදි කළ ආමොස්



බයිබල් කොටස - ආමොස් 5: 10-15, 5: 21-24, 7:14,15, 8: 4-7

**කටපාඩම් පදය:** "යුක්තිය බහින දිය දහරක් මෙන් ද ධර්මිෂ්ඨකම නොසිඳී ගලන ගඟක් මෙන් ද පැවතිය යුතුය."

(ආමෝස් 5: 24)

**ආමොස් 5: 10-15 කියවා හිස්තැන් පුරවන්න.**

ඔබ ........... මඟින් යුක්තිය ඉටු කරන්නාට ............... වන්නහු ය, අවංක ලෙස කතා කරන්නාට .............. කරන්නහු ය. ඔබ ............. පාගා දමා , ඔවුන්ගෙන් අධික ............. කොටසක් ................ ගන්නහු ය. ඒ නිසා ඔබ.............. තනාගත් ............... වාසය කරන්නේ වත්, වගා කළ සරු මිදි වතුවලින් ............. බොන්නේ වත් නැත. ඔබේ ........ කොපමණ බරපතල ද කියාත්, ඔබේ ........... කොපමණ බහුල ද කියාත් මම දනිමි. නුඹලා ............ පීඩා කරන්නහු ය,............ ගෙන උසාවිය මඟින් ............ ඉටු කරගැනීමට දුප්පතුන්ට ඉඩ නොදෙන්නහු ය. කාලය ........... බැවින් ............. වුව ද නිහඬ ව සිටිති.

- දේව වචනය නොසලකා හරින පුද්ගලයන්ට අත් දකින්නට වන ප්‍රතිවිපාක ලියන්න.
  ...........................................................................................................................
  ...........................................................................................................................
- ආමෝස් දිවැසි වරයා කියන ලද සමාජ අසාධාරණකම් මොනවා ද?
  ...........................................................................................................................
- වර්තමාන සමාජයේ දක්නට ඇති සමාජ අසාධාරණකම් මොනවා ද?
  ...........................................................................................................................
- සමාජ අසාධාරණයක් ඔබ ඉදිරියේ සිදු වන විට ඔබ ගන්නා ක්‍රියා මාර්ග උදාහරණයක් සහිතව පැහැදිළි කරන්න.
  ...........................................................................................................................
  ...........................................................................................................................
- දෙවියන් වහන්සේ ආමෝස් වැනි ගොවියෙක් ව දිවැසිවරයෙකු ලෙස තෝරා ගත්තේ ය. එසේම ඔබ සුදානම් නොමැති මොහොතක ඔබට දේව කැඳවීමක් ලැබුණොත් ඔබ දෙවියන් වහන්සේට දෙන පිළිතුර කුමක් විය හැකි ද?
  ...........................................................................................................................

**සමාජයේ පීඩනයට පත්ව ඇති ජනතාව වෙනුවෙන් සහනය ඉල්ලා යාච්ඤා කරන්න.**



9 වන ශ්‍රේණිය - 7 වන පාඩම

# මනස්ථාපනයේ සේවයට කැඳවීම ලද ජෝනා

## බයිබල් කොටස : ජෝනා පරිච්ඡේද 1-4 දක්වා

කටපාඩම් පදය : **"එසේ නම්, ඔබ පසුතැවී සිත් හරවා ගත් බව ඔබේ හැසිරීමෙන් පෙන්වන්න."** (ශු. මතෙව් 3 : 8)

- දෙවියන් වහන්සේ ජෝනාව කැඳවීමේදී ඇති වූ සංවාදය දෙබසක් ආකාරයෙන් ඔබගේ වචනයෙන් ලියන්න.

  උදාහරණ:දෙවියන් වහන්සේ : ජෝනා ඔබ සුවෙන් ද?
  ජෝනා : එසේය පියාණනි

- ජෝනා දෙවියන් වහන්සේගෙන් පලා යාම සඳහා නැගී නැවේ නාවිකයන්ට දෙවියන් වහන්සේ ගැන තිබූ ආකල්පය කුමක් ද?



- දෙවියන් වහන්සේ නිනිවය විනාශ නොකළ බැවින් එයට තරහාගත් ජෝනාට, නිනවය විනාශ නොකිරීමට හේතුව දෙවියන් වහන්සේ පහදා දුන්නේ කෙසේ ද? විස්තරාත්මකව ඔබගේ වචනයෙන් ලියන්න.

- ජෝනා පවසන ආකාරයට දෙවියන් වහන්සේ කුමනාකාරයේ දෙවියන් වහන්සේ කෙනෙක් ද?

➢ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න

- **ආරම්භයේ දී ජෝනාගෙන් දෙවියන් වහන්සේ ඉල්ලා සිටින්නේ කුමක් ද?**

  I. ගලීලයට යන්න
  II. ජෝර්දානයට යන්න
  III. නිනිවයට යන්න
  IV. තර්ෂිෂ්ට යන්න

- **නිනිවයට යන්න කියා දෙවියන් වහන්සේ කළ ඉල්ලීමට ජෝනා ප්‍රතිචාර දක්වන්නේ කෙසේ ද?**

  I. ඔහු පලා යයි
  II. ඔහු සර්කස් එකකට එකතු වෙයි
  III. කුමක් කළ යුතුදැයි ඔහු ජොෂුවාගෙන් අසයි
  IV. ඔහු නිනිවයට යයි

- **ජෝනා මුහුදේ සිටියදී කුමක් සිදුවේ ද?**

  I. ඔහු අසනීපවේ
  II. ඔහු නාවිකයන් සමග රණ්ඩු වෙයි
  III. බලවත් කුණාටුවක් හමයි
  IV. ඔහු ගී කියමින් විනෝද වෙයි

- **ජෝනා තල්මසාගේ බඩේ කොපමණ කාලයක් සිටියේ ද?**

  I. දාවල් තුනක් රෑ තුනක්
  II. දාවල් දෙකක් රෑ තුනක්
  III. දාවල් තුනක් රෑ දෙකක්
  IV. දාවල් 6ක් රෑ තුනක්

❖ දෙවියන් වහන්සේගෙන් පලා යාමට නොව උන් වහන්සේගේ අණ ඉටු කිරීමට හැකිවන ලෙස ඉල්ලා යාච්ඤා කරන්න.

සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය

**9 වෙනි ශ්‍රේණිය - 8 වෙනි පාඩම**



# ජීවිත පිළිවෙල අභියෝගයට ලක් කළ හග්ගයි

**බයිබල් කොටස : හග්ගයි 1: 2 - 11, 2: 3-9**

**කටපාඩම් පදය :** "ඔබගේ ශරීරය, ඔබට දෙවියන් වහන්සේ දෙවා වදාළළ ඔබ තුළ වැඩ වසන ශුද්ධාත්මයාණන්ගේ මන්දිරය වන බව ඔබ නොදන්නහු ද? ඔබ ඔබටම අයිති නැත."

(1 කොරින්ති 6: 19)

- හග්ගයි පොතට අනුව ඉශ්‍රායෙල්වරු දේව මාළිගාව ගොඩනගන්නේ නැත්තේ ඇයි?



  ..........................................................................................................................................

  ..........................................................................................................................................

- දෙවියන් වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ට චෝදනා කරන්නෙ කෙසේද?

  ..........................................................................................................................................

  ..........................................................................................................................................

- ඔබගේ ක්‍රිස්තියානි සභාව පරිහානියට පත්වෙද්දි සිසුවකු ලෙස ඔබට ගත හැකි පියවර කුමක් ද?

  ..........................................................................................................................................

  ..........................................................................................................................................

- ඔබගේ අසල්වැසියා, දේවස්ථානයේ සාමාජිකයන් දුකට පත්ව සිටිය දී ඔබ ඔවුන්ට උපකාර කරන්නේ කෙසේ ද?

  ..........................................................................................................................................

  ..........................................................................................................................................

❖ අපගේ සැප පහසුව පමණක් නොව අනෙකාගේ දුකට ද පිහිට වීමට හැකි වන ලෙස ඉල්ලා යාච්ඤා කරන්න.



## 9 වෙනි ශ්‍රේණිය - 9 වෙනි පාඩම

# සැබෑ නමස්කාරය

**බයිබල් කොටස : යෙසායා 58: 1-12**

කටපාඩම් පදය : **"සමිඳුන් කෙරෙහි ගරුබිය ඇති, එතුමන්ගේ මාර්ගයෙහි හැසිරෙන සියල්ලෝ භාග්‍යවන්තයෝය."**

(ගීතාවලිය 128 : 1)

- දෙවියන් වහන්සේ වෙනුවෙන් උපවාස කරන්නා වූ ඉශ්රායෙල් ජනතාව, උන් වහන්සේට චෝදනා කරන්නේ කුමක් අරභයාද?

  ..........................................................................................................................................

- දෙවියන් වහන්සේ ඔවුන්ගේ උපවාසය පිළිනොගත්තේ මක්නිසා ද?

  ..........................................................................................................................................

- මෙම උපවාස කරන ජනතාවට ඇත්තේ බාහිර භක්තියක් යැයි පැවසුවොත්, ඔබ එයට කරුණු පැහැදිලි කරන්නෙ කෙසේ ද?

  ..........................................................................................................................................

- යෙසායා 58: 1-12, හි දක්වා ඇති සමාජ අසාධාරණය පැහැදිලි කරන්න.

  ..........................................................................................................................................



- උපවාසය යන්නෙහි ඔබගේ අදහස කුමක්ද?

  ..........................................................................................................................................

- ඔබ දකින පරිදි අද සමාජයේ මිනිසුන් උපවාස කරන්නේ කුමන ඉල්ලීම් මතද?

  ..........................................................................................................................................

- උපවාස කිරීම කෙනෙකුගේ ඇදහිලිවන්ත ජීවිතයේ කොටසක් වීම පිළිබඳව ඔබ දකින්නේ කෙසේ ද?

  ..........................................................................................................................................

- ඔබ උපවාස කිරීමේ දී බලාපොරොත්තු වන පහසුකම් මොනවාද? එසේ පහසුකම් ඉල්ලීම සාධාරණද? පැහැදිලි කරන්න.

  ..........................................................................................................................................

❖ **දෙවියන් වහන්සේ වෙනුවෙන් ඔබගේ කාලය වෙන් කිරීමට හැකියාව ලබා දෙන ලෙස ඉල්ලා යාච්ඤා කරන්න.**

## 9 වෙනි ශ්‍රේණිය - 10 වෙනි පාඩම

# අරමුණු ප්‍රවර්ධන පාඩම (භාවනාව)



**බයිබල් කොටස : ගීතාවලිය 139 : 13-16**

> බයිබල් කොටස: "දෙවියන් වහන්සේගේ වචනය ජීවමානය,ක්‍රියාශීලීය, දෙමුවහත් කඩුවකටත් වඩා තියුණුය, ආත්මය ප්‍රාණයෙන් ද, සන්ධි ඇටමිදුලුවලින් ද වෙන් කරන තරම් විනිවිද යන්නේය. සිතේ සිතුවිලි ද අරමුණු ද විමසන්නේ ය."
> (හෙබ්‍රෙව් 4: 12)

දෙවියන් වහන්සේගේ වචනය කියවීම සහ එය මෙනෙහි කිරීම වෙනස් කරුණු දෙකකි. ඔබ දෙවියන් වහන්සේගේ වචනය කියවීමට පුරුදුව සිටි. නමුත් මෙම පාඩම තුළින් බයිබලය වඩාත් අර්ථවත් ලෙස භාවනාමය කියවීමකට ඔබව යොමු කරනු ලැබේ..



**භාවනාවට පෙර සූදානම :- (දේව වචනය මෙනෙහි කිරීම සඳහා)**

1. භාවනා කාලය සඳහා වේලාවක් වෙන්කර ගැනීම (අලුයම කාලය වඩා යෝග්‍ය වේ)
2. ඔබට හැකි අයුරින් බයිබලයක් සන්තකයේ තබා ගන්න.
3. භාවනාව සඳහා වෙනම සටහන් පොතක් තබා ගැනීම.
4. භාවනාව සඳහා සුදුසු නිස්කලංක තැනත් සූදානම් කරගන්න. (ඔබගේ නිවසේ පරිසරය නිශ්ශබ්ද මොහොතක එහිම තැනක් වුව ද සුදුසුය.)





**භාවනා කාලය ගත කිරීම, (දේව වචනය මෙනෙහි කිරීම)**


- ප්‍රථමයෙන් ඔබට දේව වචනය තේරුම් ගැනීමට හැකියාව ලැබෙන පිණිස උපකාර ඉල්ලා යාච්ඤා කරන්න.
- දවසට නියමිත බයිබල් කොටස ගෙන එය ඔබට තේරුම් යන තෙක් සන්සුන්ව කියවන්න. (උදාහරණ:- ගීතාවලිය 139: 13-16 )
- වැදගත් වචන සලකුණු කරගන්න.
- ඔබගේ හදවතට දැනෙන දේව පණිවිඩය මෙනෙහි කරමින් එය සටහන් කරගන්න.

➢ **දෙවියන් වහන්සේ සහ ඔබ අතර වූ සංවාදය කවියක් හෝ චිත්‍රයක් නැතිනම් දෙබසක් ආකාරයෙන් නිර්මාණාත්මකව ඉදිරිපත් කරන්න.**

❖ **දෙවියන් වහන්සේට කීකරු වෙමින් උන්වහන්සේගේ පණිවිඩය ක්‍රියාවට නංවන්නට හැකිවන ලෙස ඉල්ලා යාච්ඤා කරන්න.**

9 වෙනි ශ්‍රේණිය - 11 වෙනි පාඩම

# ජේසු කුමරු පඬිවරුන් සමඟ සංවාදයක



**බයිබල් කොටස : ශු. ලූක් 2: 41 - 50**

කටපාඩම් පදය : **"ජේසුස් වහන්සේ ප්‍රඥා මහිමයෙන් හා කාය ශක්තියෙන් ද දෙවියන් වහන්සේගෙන් හා මිනිසුන්ගෙන් ප්‍රසාදය ලබමින් ද වැඩුණු සේක."**

(ශු. ලූක් 2: 52)

- නියමිත බයිබල් කොටස කියවා හිස්තැන් පුරවන්න.

1. දේව මාළිගය පිහිටා තිබෙන්නේ ...................... ය.
2. ජේසුස් වහන්සේ මව්පියන් සමඟ දේව මාළිගයට ගොස් ඔවුන්ගේන් වෙන් වී එහි නතර වෙද්දී එතුමාගේ වයස .................... විය.
3. ජේසුස් වහන්සේ දේව මාළිගයේ වැඩ හිඳ ............. සමඟ ප්‍රශ්න විචාරමින් සිටියේය.
4. ජේසුසු වහන්සේගේ මව්පියන් උන්වහන්සේව සොයා ගත්තේ දින කීයකට පසු ද? ................

- දේව මාළිගයේ සිටියදි, ජේසුස් වහන්සේව සොයා ගත් මව්පියන්ට උන්වන්සේ ලබා දුන් පිළිතුර ඔබගේ වචනයෙන් ලියන්න.
- ජේසුස් වහන්සේ කුඩා කාලයේ හැදී වැඩුණේ කෙසේ ද?
- කුඩා ජේසු තුමාගෙන් ඔබට ගත හැකි ආදර්ශය කුමක් ද?
- දෙවියන් වහන්සේ සෙවීමට ඔබට ඇති අභියෝග මොනවා ද?



**සිතන්නට යමක් :**

මරියතුමිය සහ ජෝසෙප් තුමා සිතුවේ ජේසුස් වහන්සේ නැති වී ඇති බවයි. නමුත් එතුමා සිටිය යුතු නිවැරදි තැන සිටියේය. ඔවුන්ට ජේසුතුමා සේවීමට අවශ්‍ය වූයේ එතුමා නැති වූ නිසා නොව, එතුමා නොමැතිව ඔවුන් නැතිවූ නිසාය.

**ඔබත් නිවැරදි තැන දෙවියන් වහන්සේ සොයනවා ද?**

**ඔබගේ ජීවිතය හරවාගෙන ජේසුස් වහන්සේව සොයන්න. එවිට ඔබට දෙවියන් වහන්සේ හමුවනු ඇත.**

❖ **ජේසුස් වහන්සේ මෙන් වීමට උපකාර ඉල්ලා යාච්ඤා කරන්න.**

සැකසුම: ලංකා සහා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය



**9 වෙනි ශ්‍රේණිය - 12 වෙනි පාඩම**

# යක්ෂයා ගෙන ආ අභියෝග ජයගත් ජේසුස් වහන්සේ

**බයිබල් කොටස: ශු. ලූක් 4: 1-13**

කටපාඩම් පදය : **" උන්වහන්සේම පරීක්ෂා කරනු ලැබ, දුක් වින්ද බැවින්, පරීක්ෂා කරනු ලබන්නට සරණ වීමට උන්වහන්සේට පිළිවන."** (හෙබ්‍රෙව් 2: 18)



1. පාළුකරයේ දි සාතන් ජේසුස් වහන්සේ වෙත ගෙන ආ පරීක්ෂාවන් 3 කුමක් ද?
   1. ............................................
   2. ............................................
   3. ............................................
2. ජේසුස් වහන්සේ විසින් සාතන්ට එඩිතරව දුන් පිළිතුරු ඔබගේ වචනයෙන් ලියන්න.
   1. ............................................................................................................................................
   2. .......................................................................................................................................
   3. ............................................................................................................................................

**ඉහත 1 වෙනි සහ 2 වෙනි ප්‍රශ්න වලට අදාළ පිළිතුරු එකම පෝස්ටරයක නිර්මාණාත්මකව ඉදිරිපත් කිරීමට ද ඔබට අවස්ථාව ඇත.**

- ඔබේ දේව විශ්වාසය කෙදිනක හෝ පරීක්ෂාවට ලක් වී තිබේද? එහිදි ඔබ එයින් ගැළවුනේ කෙසේද?
  උදාහරණයක් සහිතව පැහැදිලි කරන්න.

  ............................................................................................................................................

- ඔබගේ දේව විශ්වාසය පළුදු වීමට හේතු වන බාධක සහ බාධක බිඳ දැමීම සඳහා ඔබ භාවිතා කරන ආයුධ පහත වගුවේ සඳහන් කරන්න. (උදාහරණ:- ප්‍රේමය)

| බාධක | බාධක බිඳ දැමීම සඳහා ඔබ භාවිතා කරන ආයුධ |
|---|---|
| • <br>• <br>• <br>• | • <br>• <br>• <br>• |

❖ **ජේසුස් වහන්සේ සමග කුරුසියේ මාගයේ පැමිණෙද්දි, එල්ලවන සාතන්ගේ රැවටිලි සහ පරීක්ෂාවන්ට නොහියව මුහුණදී නිවැරදි මග යාම සඳහා අවශ්‍ය කරන ශක්තිය ඉල්ලා යාච්ඤා කරන්න.**

**සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය**



**9 වෙනි ශ්‍රේණිය - 13 වෙනි පාඩම**

# සුහද සංවාදයක යෙදුණු ජේසු සමිඳුන්

**බයිබල් කොටස :- ශු. ජොහාන් 4: 1-42**

**කටපාඩම් පදය :** " තවද ප්‍රේමයට හා යහපත් ක්‍රියාවලියට අන්‍යයන් පොළඹව වන පිණිස එකිනෙකා ගැන සලකමු."

(හෙබ්‍රෙව් 10: 24)

ශු. ජොහාන් 4: 1-14 දක්වා කියවා පිළිතුරු ලියන්න.

- ජේසුස් වහන්සේ පුද්ගලයන් වෙනස් කොට නොසැලකූ බවට මෙම බයිබල් කොටසේ සඳහන්ව ඇති සාධකය කුමක් ද?

  ..............................................................................................................................................

- **"ජීවන ජලය"** පිළිබඳව ජේසුස් වහන්සේ පවසන්නේ කුමක් ද?

  ..............................................................................................................................................

- මෙම පාඩමෙන් ඔබට ඉගෙන ගතහැකි වටිනාකම් කිහිපයක් ලියන්න.

  ..............................................................................................................................................

- ජේසුස් වහන්සේගේ ඉගැන්වීම අනුව සැබෑ නමස්කාරය යනු කුමක්ද ?

  ..............................................................................................................................................

- ඔබ දන්නා පරිදි කොන් වී ඇති සමාජ කොටස් සඳහන් කරන්න.

  ..............................................................................................................................................

- අන් අය විසින් පිළිකුළට භාජනය කරන ඔබගේ මිතුරු මිතුරියන් සහ ඔබ සමඟ ඉගෙනුම ලබන අයට ඔබ ප්‍රේමය සහ කරුණාව දක්වන්නේ කෙසේ ද? පැහැදිලි කරන්න.

  ..............................................................................................................................................

**සිතන්නට යමක් :-**

**ඔබ වෙනස් වී ජේසුස් වහන්සේ මෙන් ක්‍රියා කළොත් ඔබට මේ සමාජය වෙනස් කළ හැකිය**

- ❖ **අන්‍යයන් විසින් කොන් කරන ලද අයට ප්‍රේමය ලැබීම උදෙසාත්, ඔවුන්ට ප්‍රේම කිරීමට හැකියාව ලබා දෙන ලෙසත් ඉල්ලා යාච්ඤා කරන්න.**



**9 වෙනි ශ්‍රේණිය - 14 වෙනි පාඩම**

# ආදර්ශයේ දේව ගෘහය

**බයිබල් කොටස :- ශු. මාක් 11 : 15-18**

කටපාඩම් පදය: **"ඒ අත්තිවාරම මත ගොඩනගන ලද යමෙකුගේ කර්මාන්තය නොදැවී පවතී නම්, ඔහු විපාකයක් ලබයි."**

(1 කොරින්ති 3:14)

**පහත සඳහන් ප්‍රකාශයන් හි සත්‍ය නම් සත්‍ය බව ද අසත්‍ය නම් අසත්‍ය බව ද තිත් ඉරි මත ලියන්න.**

1. දෙවියන් වහන්සේ පවසා ඇත්තේ දේව මෙහෙයන් නොමැති මොහොතක දේව ගෘහයේ ලාභ ලබන ඕනෑම දෙයක් කළ හැකි බවයි. .............
2. ජනතාව දේව මාලිගය අනිසි ලෙස භාවිත කිරීම ගැන ජේසුස් වහන්සේ කෝප විය. .............
3. ජේසුස් වහන්සේ දේව මාලිගයේ සිටි වෙළෙන්දන් සහ මුදල් මාරු කරන්නන් පලවා හැරියේය. .............
4. ජේසුස් වහන්සේ දේව මාලිගයේ සිටි වෙළෙන්දන් පිළිබඳව පූජකයන්ට පැමිණිලි කළේය. .............
5. ජේසුස් වහන්සේ දේව මාලිගය මැදින් කිසිදු දෙයක් ගෙනයන්න කිසිවෙකුට ඉඩ නුදුන් සේක. .............

- දේව ගෘහය පවතින්නේ කුමක් සඳහා ද? පැහැදිලි කරන්න.

  .......................................................................................................................................

- යම් තැනක වරදක් දුටු විට එහිදී ශිෂ්‍යයෙක් ලෙස, ඔබ හැසිරෙන්නෙ කෙසේ ද?

  .......................................................................................................................................

- ඔබගේ කෝපය පාලනය කරගැනීමට ඔබ කරන්නේ කුමක් ද?

  .......................................................................................................................................

ඔබ මෙසේ සිතා බලන්න:-

"මම කෝප වන්නේ ඇයි? එය සාධාරණ ද? "
"මට මගේ කෝපය නිවැරදිව හැසිරවිය හැකිද?"

- **සැබැවින්ම ඔබ කෝපවිය යුතු අවස්ථා තිබේ. එහෙත් මතක තබා ගන්න, ඔබ කෝපයෙන් සිටියදී කිසිදු ක්‍රියාවක් හෝ ප්‍රකාශයක් නොකරන්න. සන්සුන් වීමට ඔබ ඔබටම කාලය ලබා දෙන්න.**



- **වැරදිදේ ට විරුද්ධ වන්න ත්, සියල්ලන් විරුද්ධ වුව ත් නිවැරදි මඟම යාමට අවශ්‍ය ශක්තිය ත් ඉල්ලා යාච්ඤා කරන්න.**

සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝසීසිය



**9 වෙනි ශ්‍රේණිය - 15 වෙනි පාඩම**

# නිහතමානිත්වයේ ජේසුස් වහන්සේ

**බයිබල් කොටසඃ- ශු. ජොහාන් 13ඃ 1-20**

**කටපාඩම් පදයඃ"කුමක් හෙයින් ද මනුෂ්‍ය පුත්‍රයාණන් වුවද වැඩියේ සේවය ලැබීමට නොව සේවය කිරීමටය. බොහෝ දෙනා උදෙසා මිදීමේ මිලයක් වී සිය දිවි පිදීමටය."**

(ශු. මාක් 10ඃ 45)

- තම ගෝලයන්ගේ පාද සේදීමෙන් ජේසුස් වහන්සේ අර්ථවත් කළේ කුමක් ද?

  ……………………………………………………………………………………………………………………

- ජේසුස් වහන්සේ මෙහිදී ඔබට ලබා දුන් ආදර්ශය කුමක් ද?

  ……………………………………………………………………………………………………………………

- මෙම බයිබල් කොටසේ සඳහන් වන, තම නුදුරු අනාගතය පිළිබඳව ජේසුස් වහන්සේ දැන සිටි කරුණු දෙක කුමක් ද?

  ……………………………………………………………………………………………………………………

  ……………………………………………………………………………………………………………………

- ඔබට යම් නායකත්වයක් ලැබුණොත් ඔබ එහි අන් සාමාජිකයන් සමඟ ක්‍රියා කරන්නේ කෙසේ ද?

  ……………………………………………………………………………………………………………………


- උඩගුකමෙන් ඔබ මිදෙන්නේ කෙසේ ද?

  ……………………………………………………………………………………………………………………

සිතා බලන්න ඃ

- ජේසුස් වහන්සේ මෙන් මට ද්‍රෝහි කම් කරන පුද්ගලයකු පිළිබඳ දැන දැනම ඔහුට හෝ ඇයට යහපත කිරීමට හැකි ද?
- මම අණ කරන්නේකු ද? සේවය කරන්නෙකු ද
- මම අන් අය වෙනුවෙන් සේවය කර ඇත් ද?
- මම නිහතමානී ද?

❖ **A4 කොළයක් රැගෙන හදවතේ හැඩයට රූපයක් කපා එහි එක් පැත්තක ඔබගේ ජීවිතයේ වටිනාකම් ද අනෙක් පැත්තේ ඔබගේ ජීවිතයේ දුර්වලතා ලියන්න. එම කොළය අතට ගෙන ඔබට දී ඇති වටිකාකම් ගැන දෙවියන් වහන්සේට ස්තුති කර දුර්වලතාවයින්ගෙන් ජය ගැනීමට උදව් ඉල්ලන්න.**



සැකසුමඃ ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය



### 9 වෙනි ශ්‍රේණිය - 16 වෙනි පාඩම

# එකමුතුකම උදෙසා යාච්ඤාව

**බයිබල් කොටසː- ශු. ජොහාන් 17:11, 21-22**

**කටපාඩම් පදයː " ආත්මයාණන් වහන්සේගෙන් වන එක්සත්කම සමගිකමේ බැම්මෙන් පවත්වාගන්නට උත්සහා කරන්න." (එපීස 4:3)**

**ජේසු තුමා දෙවියන් වහන්සේට කළ දීර්ඝතම යාච්ඤාවේ දි ඔබ වෙනුවෙනුත් යාච්ඤා කළ බව ඔබ දැන සිටියා ද? එතුමා අප සියලු දෙනා වෙනුවෙන් යාච්ඤා කළේය. උන් වහන්සේ තම සභාව වර්ධනය වන බවත් ඒකත්වයෙන් සිටිය යුතු බවත් දැන සිටියේ ය. ඒ වෙනුවෙන් එතුමා යාච්ඤා කළ සේක.**

**"සුවිශුද්ධ පියාණෙනි, අප මෙන් ඔවුන් ද ඒකත්වයක් වන පිණිස ඔබ මට දුන් ඔබගේ නාමයේ අනුහසින් ඔවුන් ආරක්ෂා කළ මැනව"**

**අපට එක හා සමානව සිතීමට නොහැකි විය හැකිය. නමුත් අප එකිනෙකාට එක හා සමානව ප්‍රේම කළ යුතු බව ජේසුස් වහන්සේ අපට කියා දෙයි.**

- ජේසුස් වහන්සේ ඔබ ඉපදීමටත් පෙර ඔබ ගැන දෙවියන් වහන්සේට යාච්ඤා කර ඇත. එය ඔබගේ හදවතට දැනෙන්නේ කෙසේ ද? (කවියක් , ගීතයක්, චිත්‍රයක් හෝ රචනයක් ලියන්න)

- ජේසුස් වහන්සේ අන්‍යයන් වෙනුවෙන් යාච්ඤා කළ සේක. අන්‍යයන් වෙනුවෙන් ඔබට දෙවියන් වහන්සේගෙන් ඉල්ලීමට ඇත්තේ කුමක් ද?
  ........................................................................................................



- එක්සත් කම යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද?
  ........................................................................................................
- ඔබගේ සභාව තුළ ඒකත්වය ගොඩ නඟා ගැනීමට ඉරුදින පාසල් සිසුවෙකු ලෙස ඔබ කුමක් කළ යුතු ද?
  ........................................................................................................
- වෙනත් විශ්වාසයන් දරන පුද්ගලයන් සමඟ අපගේ එකමුතු කම පෙන්විය හැකි ප්‍රායෝගික ක්‍රම මොනවාද?.......................................................................................................................
- ඔබගේ පවුලේ එකමුතුකම වෙනුවෙන් ඔබ දායකත්වය සපයන්නේ කෙසේද?.
  ........................................................................................................................................
- ජේසුස් වහන්සේගේ යාච්ඤාවේ ඔබ ඉගෙන ගත් විශේෂම දෙය කුමක් ද?
  ........................................................................................................................................

- **ජේසුස් වහන්සේ ඔබ වෙනුවෙන් කළ දේවල් වලට ඔබ කවදා හෝ ස්තුති කර ඇත් ද? උන් වහන්සේ වෙනුවෙන් ඔබගේ සිත කම්පා වී නැත් ද? එසේ නම් මේ උතුම් මිනිසා ඔබ හා මා වෙනුවෙන් කළ දේවල් පිළිබඳව දෑස් මොහොතක් වසා මෙනෙහි කර බලන්න. උන්වහන්සේ අපෙන් බලාපොරොත්තු වූයේ බොහෝ සුළු දෙයක්ය. එනම් අප එකිනෙකාට ප්‍රේම කිරීමත් සියල්ලන් හා එක්සත්ව සිටීමයි. එය උන් වහන්සේ වෙනුවෙන් අද සිට ක්‍රියාත්මක කිරීමට සිතට ගමු. එයයි උන් වහන්සේ වෙනුවෙන් අපට දිට හැකි හොඳම ස්තුතිය වන්නේ.**

**සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය**



**9 වෙනි ශ්‍රේණිය - 17 වෙනි පාඩම**

# අන්තිම රාත්‍රි භෝජනය

**බයිබල් කොටසඃ ශු. මාක් 14: 12 - 26, ශු . ජොහාන් 13**

කටපාඩම් පදයඃ **"ස්වර්ගයෙන් පහළ වන ජීවනදායක ආහාරය මමය. යමෙක් මෙම ආහාරයෙන් වැළඳුවහොත්, ඔහු සදහටම ජීවත් වන්නේය. මා විසින් දෙනු ලබන ඒ ආහාරය මාගේ මාංශය වේ. මා එය දෙන්නේ ලෝකයාගේ ජීවනය පිණිසය" යි වදාළ සේක.** (ශු. ජොහාන් 6: 51)

- පැරණි ගිවිසුමට අනුව ජුදෙව්වරු පාස්කු මංගල්‍යය වැදගත් ලෙස සැලකුවේ ඇයි? (ඔබගේ බයිබලිය සාමාන්‍ය දැනුම භාවිතා කර පිළිතුර ලියන්න)



- පාස්කු මංගල්‍යයට පවසන වෙනත් නමක් ලියන්න.......................................................
- ක්‍රිස්තියානි අපට මෙම දිනය වැදගත් වන්නේ ඇයි?


  ..............................................................................................................................

  ..............................................................................................................................
- රොටි කඩා, මිදි යුෂ ගෝලයන්ට පානය කිරීමට දීමෙන් ජේසුස් වහන්සේ සංකේතවත් කළේ කුමක් ද? එහිදි උන් වහන්සේ භාවිතා කළ වදන් මොනවාද?

  ..............................................................................................................................

  ..............................................................................................................................
- ජේසුස් වහන්සේ ගෝලයන්ගේ පාද සේදීමෙන් අර්ථවත් කළේ කුමක් ද?

  ..............................................................................................................................



- තමා මරණයට පාවා දෙන පුද්ගලයා සමඟ එකට හිඳ එකම රොටිය කඩා අනුභව කිරීමෙන් ජේසුස් වහන්සේ අපට ඉගැන්වූ පාඩම කුමක්ද ?

  ..............................................................................................................................
- **ඔබ සියලු දෙනා මා අත්හැර යන බව** ජේසුස් වහන්සේ පැවසූ අවස්ථාවේ දී පේදුරු තුමා ප්‍රකාශ කළේ කුමක්ද?

  ..............................................................................................................................
- "**මාව පාවා දෙන්නා මෙතන සිටිතියි**" ජේසුස් වහන්සේ පවසන විට ඔබ එදා උන් වහන්සේ සමඟ එම මේසයේ හිඳගෙන සිටියේ නම් ඔබ කුමක් කරන්නේ ද? ඔබ කුමක් කියන්නේ ද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

**සිතා බලන්න:- ජේසුස් වහන්සේ තම ගෝලයන්ගේ පාද සේදූ සේක. තමන් වහන්සේව පාවා දෙන බව දැන දැනත් ඔවුන් සමඟ ආහාර වැළඳූ සේක. ඔබ ජේසුස් වහන්සේ මෙන් යටහත්පහත් දරුවෙක් ද?**

**ඔබ ජේසුස් වහන්සේ පාවා දෙන ආකාර ගැන සිතා බලන්න. එසේ නොකිරීමට හැකි වන ලෙස ඉල්ලා යාච්ඤා කරන්න.**

**සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය**

9 වෙනි ශ්‍රේණිය - 18 වෙනි පාඩම

# කුරුසි මඟ දුක දැරූ ජේසු තුමා



**බයිබල් කොටස : ශු. මාක් 14: 43 -50**

**කට පාඩම් පදය:** " බලන්න, අපි ජෙරුසලමට යම්හ. මනුෂ්‍ය පුත්‍රයාණෝ නායක පූජක වරුන්ටත්, විනයධරයන්ටත් පාවා දෙනු ලබති. ඔව්හු එතුමාණන් මරණයට නියම කොට විජාතීන්ට පාවා දෙන්නෝය."

(ශු. මාර්ක් 10: 33)

- ජුදස් ජේසු තුමාව පාවා දීමට ක්‍රියා කළේ කෙසේ ද?

  ........................................................................................................................

- ජේසුස් වහන්සේ අත්අඩංගුවට ගැනීමට ඒමේදී ජුදස් ජේසුස් වහන්සේ ආමන්ත්‍රණය කළේ කෙසේ ද?

  ........................................................................................................................

- ඔවුන් ජේසුස් වහන්සේ අත්අඩංගුවට ගත්තේ කෙසේ ද?

  ........................................................................................................................

- ගෝලයන් සියලු දෙනා ජේසුස් වහන්සේ අතහැර පලා යාමේ දී උන් වහන්සේට කෙසේ හැගෙන්නට ඇත් ද? ?

  ........................................................................................................................

- අත්අඩංගුවට පත් වීමේදි ජේසුස් වහන්සේ එයට විරුද්ධතාවයක් නොපෑවේ කුමක් නිසාද?

  ........................................................................................................................

- ඔබ කෙදිනක හෝ පාවා දීමකට ලක් වී ඇත් ද? ඔබ එහිදි ක්‍රියා කළේ කෙසේ ද?
- ඔබ ඔබගේ මිතුරන් පාවා දී ඇත් ද? එහිදි ඔබගේ සිතට දැනුනේ කුමක් ද?
- ඔබගේ මිතුරෙක් හෝ මිතුරියක් වෙනත් අයෙකු පාවා දෙනු ඔබ දැක ඇත් ද?

❖ **සිතා බලන්න ඔබ තවමත් උන් වහන්සේ තනිකර පලා යනවා ද? අන් අය ඉදිරියේ උන් වහන්සේව ලජ්ජාවට පත් කරමින් සිටිනවා ද?**

❖ ඔබ උදේසා දෙවියන් වහන්සේට ඇති සැලැස්ම හෙළි කර දෙන මෙන් ඉල්ලා යාච්ඤා කරන්න.



9 වෙනි ශ්‍රේණිය - 19 වෙනි පාඩම

# කුරුසියේ දිවි පිදූ ජේසු තුමා

**බයිබල් කොටස : ශු. මාක් 15: 21 - 47**

කටපාඩම් පදය: **"දෙවියන් වහන්සේ ලෝකයාට කොතරම් ප්‍රේම කළ සේක් ද කීවොත් ස්වකීය ඒකජාතක පුතණුවන් වුව ද ලොවට දෙවා වදාළ සේක. එසේ කළේ, උන් වහන්සේ කෙරෙහි අදහන සියලු දෙනාම විනාශ නොවී සදාතන ජීවනය ලබන පිණිසය "**

(ශු. ජොහාන් 3: 16)

## හිස්තැන් පුරවන්න

1. ................................ නම් මඟියෙකුට උන් වහන්සේගේ කුරුසිය උසුලාගෙන යාමට ඔව්හු බල කළහ.
2. කපාලපිටිය යන අර්ථය ඇති .................. නම් තැනට උන් වහන්සේ ගෙන ගියහ.
3. සුවඳලාටු මුසු ..................... උන් වහන්සේට බොන්නට දුන් නමුත් උන් වහන්සේ එය ප්‍රතික්ෂේප කරන ලදි.
4. උන් වහන්සේගේ වස්ත්‍ර බෙදා ගැනීමට ඔව්හු ........................ දැමූහ.
5. ඔවුන් උන් වහන්සේ ඇණ ගසනු ලැබුවේ හිරු උදා වී ............................ පසුවය.
6. උන් වහන්සේගේ චෝදනා පුවරුවේ ලියා තිබුණේ ............................... ලෙසය.
7. උන් වහන්සේ ................................... සමඟ ගණන්ගනු ලැබූ සේක.



## අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

- ජේසුස් වහන්සේට කුරුසිපත් වීමට සිදු වූයේ ඇයි? ඔබගේ වචනයෙන් පිළිතුරු ලියන්න.
- ඔවුන් **ජුදෙව්වන්ගේ රජ** යන ලකුණ ජේසුස් වහන්සේගේ කුරුසියේ තැබුවේ ඇයි?
- ඔබ දේව දරුවකු ලෙස ජේසුස් වහන්සේගේ කුරුසියේ බර දරා ගැනීමට උපකාර කරන්නේ කෙසේ ද?
- **"එලොයි එලොයි ලාමා සබක්තානි"** යන්නෙහි අර්ථය කුමක් ද?
- **"ජේසුස් වහන්සේ මා නිසා කුරුස ගසේ දී පිදූ සේක."** යන මැයෙන් රචනයක් ලියන්න.

**ඔබගේ පාප වෙනුවෙන් මිය ගිය ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේට ස්තූති කිරීමට ඔබ කැමති ද? ඔබට එය මේ මොහොතේදී ම එය කළ හැකිය.**

**ආදර ජේසු තුමනි ! මාගේ පව් නිසා මිය යාමට තරම් ඔබ වහන්සේ මට ප්‍රේම කළ නිසා මම ඔබ තුමාට ස්තූති වන්ත වෙමි. මාගේ ගැළවුම් කරුවා පමණක් නොව මාගේ හොඳම මිතුරා වීමට මම ඔබ තුමාට ආරාධනා කරමි.**



### 9 වෙනි ශ්‍රේණිය - 21 වෙනි පාඩම

# ශුද්ධාත්ම මඟ පෙන්වීම ලද අන්තියෝකියේ සභාව

**බයිබල් කොටස : ක්‍රියා 11: 19 - 30**

**කටපාඩම් පදය: " සමිඳාණන් වහන්සේගේ බලය ඔවුන් මත පහළ විය. එකල විශාල සංඛ්‍යාවක් අදහාගෙන සමිඳාණන් වහන්සේ වෙතට හැරුණාහ."**

**(ක්‍රියා 11: 21)**

- මෙම බයිබල් කොටසට අනුව විසිරුවනු ලැබුවත්, සභාව වර්ධන වූ බවට ඇති සාධකය කුමක්ද? ඔබගේ වචනයෙන් පිළිතුර ලියන්න.

  ..............................................................................................................................................

- ශුද්ධාත්මයාණන්ගේ බලය (සමිඳාණන්ගේ බලය) සභා සාමාජිකයන් මත පහළ වීමෙන් සිදු වූයේ කුමක් ද?

  ..............................................................................................................................................

- බාර්ණබස් අන්තියෝකයට පැමිණ අනුශාසනා කළේ කුමක් ද?

  ..............................................................................................................................................

- අන්තියොකයේදී සභාව පිළිබඳ විශේෂ දෙයක් සිදුවිය ඒ කුමක් ද?

  ..............................................................................................................................................

- ලොව පුරා සාගතයක් ඇති වන බව ශුද්ධාත්මානුභාවයෙන් ප්‍රකාශ කළේ කවරෙක් ද?

  ..............................................................................................................................................

- පීඩා මැදදී සේවය කරමින් එකිනෙකාට උපකාර කිරීම පිළිබඳව අන්තියෝකි සභාව අපට ආදර්ශයක් ගෙන එයි උදාහරණයක් සපයන්න.

  ..............................................................................................................................................

- ඔබ තේරුම් ගෙන ඇති ආකාරයට සභාව යන්නෙහි අර්ථය කුමක් ද?


  ..............................................................................................................................................

- කිතුනු සභාව වර්ධනය වීම සඳහා ඔබට දායක විය හැක්කේ කෙසේ ද?

  ..............................................................................................................................................

**ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය කෙරෙහි විශ්වාසයෙන් ජීවත් වන්න, එය පීඩාව මැදදී අප ශක්තිමත් කරයි.**

❖ **ක්‍රිස්තුස් වහන්සේ මත වැඩෙන දෙවියන වහන්සේගේ සභාව ගොඩනැගීම සඳහා ඔබවත් යොදා ගන්නා ලෙස ඉල්ලා දෙවියන් වහන්සේට යාච්ඤා කරන්න.**



## 9 වෙනි ශ්‍රේණිය - 22 වෙනි පාඩම

# ක්‍රිතු සසුනේ ඉදිරි ගමන



**බයිබල් කොටස :ක්‍රියා 9:1-31, 11:25-30, 13:1-12, ගලාති 1:15-24**

**කටපාඩම් පදය: ඔව්හු ප්‍රේරිතවරුන්ගේ ඉගැන්වීමෙහි ද, සහභාගිකමේහි ද රොටි කැඩීමෙහි ද යාච්ඤාවෙහි ද නිරතව කල් ගත කළහ.**(ක්‍රියා 2 : 42)

- විජාතිකයින් වෙත ශුභාරංචිය ගෙන යාමට ක්‍රිස්තුස් වහන්සේගේ දිව්‍යාත්මානුභාවය විසින් තෝරාගනු ලැබුවේ කවරෙක්ව ද?

 ..................................................................................................................................................

- සාවුල් සොයා තාර්සසයට ගියේ කව්ද? ඔවුන් දෙදෙනා අන්තියෝකයේදී කරනු ලැබූ සේවය කුමක් ද?

 ..................................................................................................................................................
 ..................................................................................................................................................

- ජනතාව සාවුල්ගේ ජීවිතය පිළිබඳව දෙවියන් වහන්සේට ස්තුති කළේ මන්ද? (ගලාති 1:15-24 කියවා පිළිතුරු ලියන්න)

 ..................................................................................................................................................
 ..................................................................................................................................................

- ක්‍රිතු සසුනේ ඉදිරි ගමනට පාවුල් තුමාගෙන් ලැබුණු දායකත්වය ඔබගේ වචනයෙන් විස්තර කරන්න.

 ..................................................................................................................................................
 ..................................................................................................................................................
 ..................................................................................................................................................
 ..................................................................................................................................................


- සාවුල් තුමාගේ හැරීම පිළිබඳව කෙටි රචනයක්, දෙබසක් හෝ චිත්‍රයක් වැනි නිර්මාණාත්මක යමක් කරන්න.

  - **ඇතැම් අවස්ථාවන්වලදී ඔබගේ මිතුරන් අහංකාර සහ නපුරු ලෙස හැසිරෙද්දී එම පුද්ගලයා වෙනස් කිරීම උදෙසා ඔබ ගන්නා පියවර කුමක්ද?**

**❖සියලු අභියෝග මධ්‍යයේ නිවැරදි මාර්ගයේ ගමන් කිරීමට උදව් කරන ලෙස ඉල්ලා දෙවියන් වහන්සේට යාච්ඤාවක් ලියන්න.**








**9 වෙනි ශ්‍රේණිය - 23 වෙනි පාඩම**

# ශුද්ධ වූ බයිබලය

**බයිබල් කොටස : ගීතාවලිය 119: 105**

කටපාඩම් පදය: **"දේවානුභාවයෙන් යුත් මුළු ශුද්ධ ලියවිල්ල, ඉගැන්වීමට ද දුර්මත දුරුකිරීමට ද හික්මවීමට ද දැමිටු ජීවිතයක් ගත කිරීම පිණිස උපදෙස් දීමට ද ප්‍රයෝජනවත් වෙයි."** (2 තිමෝති 3: 16)

## බයිබලය හැඳින්වීම

දේවානුභාවයෙන් රචිත ශුද්ධ වු බයිබලය ලෝකයේ සියලුම දේශයන් හි ජීවත් වන ක්‍රිස්තු භක්තිකයන්ගේ ඇදහිල්ලට පදනම් වන අති පූජනීය ග්‍රන්ථයයි. පොත යන අරුත ඇති **"බිබ්ලියා"** නම් ග්‍රීක වචනයෙන් **බයිබලය** යන වචනය සෑදේ. **පැරණි ගිවිසුම** සහ **අලුත් ගිවිසුම** යනුවෙන් බයිබලය කොටස් දෙකකින් සමන්විත වේ. පරණ ගිවිසුමෙහි සඳහන්වන කථාන්දර ලේඛනගත වීමට පෙර පරම්පරාවෙන් පරම්පරාවට පැවති ඒවා විය. එයට, "මුඛ පරම්පරාගත සම්ප්‍රදය" යයි කියනු ලැබේ. යුදෙව්වන්ගේ භාෂාව වූ හෙබ්‍රෙව් භාෂාවෙන් පරණ ගිවිසුම ලියා ඇත. එකල භාවිතා කළ ලෝක භාෂාව වූ ග්‍රීක භාෂාවෙන් අලුත් ගිවිසුම ලියා ඇත. (මෙම භාෂාවන් මධ්‍යධරණී ලෝකය තුළ බහුලව භාවිතා කර ඇත) පසුව මුළු බයිබලයම බොහෝ භාෂාවන්ට පරිවර්තනය කර ඇත.

පැරණි ගිවිසුමේ පොත් 39 කි. එය ජේසුස්වහන්සේට  පෙර වන අතර, ජේසුස්වහන්සේ සහ අපෝස්තුළුවරුන්ට ශුද්ධ ලියවිල්ල (බයිබලය ) වූයේ පැරණි ගිවිසුමයි. ජේසුස් වහන්සේ පැරණි ගිවිසුම විශ්වාස කරමින් එයින් උපුටා දැක්වීය, අලුත් ගිවිසුම ජේසුස් වහන්සේට පසුවය. සමදර්ශක ශුභාරංචි හා, ක්‍රියා හා යැවුම් පත්‍ර (හසුන්)සමග එහි පොත් 27 කි. ඇතැමුන් පවසන පරිදි පැරණි ගිවිසුමෙ ඇති බයිබල් පද 855 ක් නව ගිවිසුමේ උපුටා දක්වා ඇත. පැරණි ගිවිසුම. නව ගිවිසුම කෙරෙහි අපේක්ෂාවෙන් සිටින අතර නව ගිවිසුම පැරණි ගිවිසුමෙන් සම්පූර්ණ වීමයි.

පොත් මාලාවක එකතුවක් වන ශුද්ධ බයිබලය එකම ග්‍රන්ථයක් ලෙස සැලකෙන්නේ එහි පොදු තේමා කිහිපයක් දක්නට ලැබේන බැවිනි. දෙවියන් වහන්සේ සහ මිනිසා අතර සම්බන්ධතාවය, ජේසුස් වහන්සේ තුළ **"ගැළවීම" ,** මිනිස් සංහතියට දෙවියන්වහන්සේගේ එළිදරව්වීම හා දෙවියන් වහන්සේට ලැබෙන මිනිස් ප්‍රතිචාරය උදාහරණ ලෙස දැක්විය හැකිය.

**බයිබලයේ ඇති පොත් පහත වගුවේ සඳහන් වේ ඒවා කියවා මතක තබා ගැනීමට උත්සහ කරන්න.**

| ඉතිහාසය | නිතිය | සාහිත්‍ය | දිවැස්වැකි | ශුභාරංචි | හසුන්පත් | එළිදරව් කිරීම |
|---|---|---|---|---|---|---|
| ජොෂුවා | උත්පත්ති | රූත් | යෙසායා | මතෙව් | රෝම | දානියෙල් |
| වීරාවලිය | නික්මයාම | එස්තර් | ජෙරමියා | මාර්ක් | 1කොරින්ති | එළිදරව් |
| 1සාමුවෙල | ලෙවි ව්‍යවස්ථාව | ජෝබ් | එසකියෙල් | ලුක් | 2කොරින්ති | |
| 2සාමුවෙල් | ගණන් කථාව | ගීතාවලිය | හොසියා | ජොහාන් | ගලාති | |
| 1රාජාවලිය | ද්විතීය නීතිසංග්‍රහය | හිතෝපදේශ | ජෝවෙල් | | එපීස | |
| 2රාජාවලිය | | ධර්මදේශකයා | ආමොස් | | පිලිප්පි | |
| 1වංශාවලිය | | ප්‍රේම ගී | ඔබදියා | | කොලොස්සි | |
| 2වංශාවලිය | | විලාප ගී | ජෝනා | | 1තෙසලෝනික | |
| එස්රා | | | මිකා | | 2තෙසලෝනික | |
| නෙහෙමියා | | | නාහුම් | | 1 තිමෝති | |
| ප්‍රේරිතයන්ගේ | | | හබක්කුක් | | 2 තිමෝති | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ක්‍රියා | | | ශෙපනියා<br>හග්ගයි<br>සෙකරියා<br>මලාකි | | තීතස්<br>පිලොමන්<br>හෙබ්‍රෙව්<br>යාකොබ්<br>පේදුරු 1 සහ 2<br>ජොහාන් 1,2,3<br>ජූද් | |

- බිබ්ලියා යන්නෙහි අරුත කුමක් ද?.......................................................................................
- බයිබලය රචනා වී ඇත්තේ කෙසේ ද?..................................................................................
- බයිබලයේ මුළු පොත් ගණන කොපමණ ද?...........................................................................



- බයිබලයේ ප්‍රධාන කොටස් දෙක කුමක් ද?
  ......................................................................................................................
- පරණ ගිවිසුම ප්‍රථමයෙන් රචනා කර ඇත්තේ කුමන භාෂාවෙන් ද?...............................
- විවිධ කතුවරු විසින් රචනා කරන ලද පොත් ගණනාවක් ඇතත් බයිබලය එකම ග්‍රන්ථයක් ලෙස සැලකෙන්නේ ඇයි?
  ......................................................................................................................
- ඔබ දන්නා පරිදි ජේසුස් වහන්සේ ජීවත්ව සිටි කාලය ගැන රචනා වී ඇත්තේ කුමන පොත් වලද?
  ......................................................................................................................
- ඔබ බයිබලයේ වඩා කියවීමට කැමතීම පොත කුමක් ද?......................................................
- ඔබගේ හදවතට දැනුන බයිබල් පාඨය කුමක් ද?..............................................................
- බයිබලයේ එන චරිත අතරින් ඔබ වඩා ප්‍රිය කරන චරිතය කුමක් ද?...............................

❖ **ඔබ සන්තකයේ බයිබලයක් තබා ගන්න.**

❖ **දිනපතා බයිබලය කියවා සිතට දැනුන බයිබල් පාඨය පොතක ලියන්න.(ඔබට මේ සඳහා භාවනා පොතක් සාදා ගත හැකිය.)**

❖ **දේව වචනය පිළිබඳව යාච්ඤාවෙන් මෙනෙහි කිරීම සඳහා භාවනා කාලයක් ගත කරන්න.** (භාවනාව සඳහා පහසු වෙලාවත් සහ ස්ථානයක් යොදා ගත හැකිය)

❖ **පවුලේ සියලු දෙනා සමඟ බයිබලය කියවමින් යාච්ඤා කාලයක් ගත කරන්න.**

❖ **ඔබ ඉගෙන ගත් බයිබල් කතා ඔබගේ මිතුරු මිතුරියන් සමඟ බෙදාගන්න.**

❖ බයිබලය මගින් වඩවඩාත් දෙවියන් වහන්සේ පිළිබඳව දැන ගැනීමටත් උන් වහන්සේට සමීප වීමටත් දේව වාක්‍යයෙන් සැනසිල්ල ලබා ගැනීමටත් හැකියාව ඉල්ලා යාච්ඤා කරන්න.



## 9 වෙනි ශ්‍රේණිය - 24 වෙනි පාඩම

# ක්‍රියාකාරී ඇදහිල්ල

**බයිබල් කොටස: ජාකොබ් 2: 14 -26**

**කටපාඩම් පදය : "හුස්ම නැති සිරුර මළ සිරුරක් වන සේම ක්‍රියා නැති ඇදහිල්ල මළ ඇදහිල්ලකි."**

**(ජාකොබ් 2: 26)**


- මෙම බයිබල් කොටසට අනුව ඔබ ඇදහිල්ල පිළිබඳව ඉගෙන ගත්තේ කුමක් ද?
  ..............................................................................................................................................
  ..............................................................................................................................................
- ජාකොබ් 2:16 හි ප්‍රකාශ වන්නේ කුමක්දැයි ඔබගේ වචනයෙන් පැහැදිලි කරන්න
  ..............................................................................................................................................
  ..............................................................................................................................................
- ක්‍රියාවෙන් තම ඇදහිල්ල පෙන්වූ පැරණි ගිවිසුමේ එන පුද්ගලයකු පිළිබඳව මෙම බයිබල් කොටසේ විස්තර කරයි. එම පුද්ගලයා කවරෙක් ද?
  ..............................................................................................................................................
- ඉහත සඳහන් පුද්ගලයා ක්‍රියාවෙන් තම ඇදහිල්ල පෙන්වූයේ කෙසේ ද?
  ..............................................................................................................................................
  ..............................................................................................................................................
- **ඔබ ඔබගේ ඇදහිල්ල ක්‍රියාවෙන් පෙන්නුම් කළ අවස්ථා කිහිපයක් ලියන්න**



..............................................................................................................................................
..............................................................................................................................................
..............................................................................................................................................

**දෙවියන් වහන්සේ සහ ඔබ අතර සැබෑ සම්බන්ධතාවය අන්‍යයන්ට ප්‍රේම කිරීමෙන් සහ උපකාර කිරීමෙන් සනාථ කළ හැකිය. ඔබ අන්‍යයන්ට උපකාර කළ යුත්තේ ඔබගේ මුළු හදවතින්ම මිස ප්‍රසිද්ධිය සඳහා නොවිය යුතුය. මන්ද ඔබගේ සිතුවිල්ල පවා දෙවියන් වහන්සේ දන්නා සේක. ඔබගේ ඇදහිල්ල අනුව එතුමා ඔබට විපාක දෙනු ලැබේ.**

- ❖ **දෙවියන් වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් සිටීමටත් ඒ තුළින් අන්‍යයන්ට ප්‍රේම කිරීමටත් හැකියාව ලබා දෙන ලෙස ඉල්ලා යාච්ඤා කරන්න**



## 9 වෙනි ශ්‍රේණිය - 25 වෙනි පාඩම

# එස්තර්

**බයිබල් කොටස : එස්තර් 2:5-7, 4:1-16, 5: 1-8**

**කටපාඩම් පදය: “නුඹලාගේ සෞභාග්‍ය පිණිස මිස විපත්තිය පිණිස නොවන, නුඹලාගේ අනාගත බලාපොරොත්තු මුදූන් පමුණුවා දෙන මාගේ යෝජනා මම හොඳින් දනිමි. මෙසේ පවසන්නේ ස්වාමීන් වන මමය. ”**

**(ජෙරමියා 29: 11)**

**ගැළපෙන පිළිතුරු යා කරන්න.**

| | |
|---|---|
| • මොර්කදෙයිගේ ගෝත්‍රය වේ | සුසාහි |
| • එස්තර්ව හඳුන්වන වෙනත් නමකි | අහෂ්වේරොෂ් |
| • ජුදෙව්වරුන් නැති කිරීමට ක්‍රියා කළ පුද්ගලයා | බෙන්ජමින් |
| • එස්තර් විවාහා වුයේ මෙම රජු සමඟය | හාමාන් |
| • එස්තර්ව හදාගත් පියා මොහුය | හදස්සා |
| • එස්තර් වාසය කළේ මෙහිය | මොර්කදෙයි |



- එස්තර් රැජින තුළින් ඔබ දුටු වීරවරියකගේ චරිත ලක්ෂණ ලියන්න.
- ජුදෙව්වරුන්ගේ ගැළවීම උදෙසා එස්තර් රැජින ක්‍රියා කළේ කෙසේ ද?
- ඔබගේ ජීවිතයට එස්තර් රැජිනගෙන් ගත හැකි ආදර්ශය කුමක් ද?

- ඔබ දන්නා බයිබලීය වීරවර වීරවරියන් සතු පොදු ලක්ෂණ මොනවාද?
- ඔබ කැමතිම බයිබලයේ එන වීර චරිතය කුමක් ද?

❖ **අවශ්‍ය මොහොතේ දී අන් අය වෙනුවෙන් පෙනී සිටීමට අවශ්‍ය ධෛර්‍යය ඉල්ලා යාච්ඤා කරන්න.**



## 9 වන ශ්‍රේණිය - 26 වෙනි පාඩම

# මීකා දිවැසිවරයා

**බයිබල් කොටස : මීකා 4: 1-5**

**කටපාඩම් පදය: "එම්බා මනුෂ්‍යය! යහපත් දේ කුමක් දැයි සමිඳාණන් ඔබට පෙන්වා දී ඇත. එතුමාණන් ඔබෙන් ඉල්ලන්නේ කුමක් ද? යුක්තිය ඉටු කිරීමත්, දයා පෙම දැක්වීමත්, යටහත් ලෙස ඔබේ සමිඳුන් සමඟ හැසිරීමත් පමණකි. "**

**(මීකා 6:8)**

## හැඳින්වීම

මීකා දිවැසිවරයා ජුදා නම් දකුණු දිශා රාජ්‍යයේ මෝරෙෂෙත්හි වැසියෙකි. දෙවියන් වහන්සේගේ වචනය ඔහු වෙත පැමිණියේ ජෝතාම්, ආහාස් හා හෙසකියා යන රජවරුන් ජුදාහි රජකම් කරන කාලයේදිය. දෙවියන් වහන්සේ ජුදා දේශයේ ජනතාවට, විප්‍රවාසයට පෙර දේව පණිවුඩය ගෙන යෑමට තෝරා ගත් දිවැසිවරයෙකි. ජුදා සෙනඟට ඔවුන්ගේ පාපයට ලැබෙන දඬුවම පිළිබඳව අනතුරු හැඟවීමක් සමඟ අනාගතයේ සාම යුගය පිළිබඳව බලාපොරොත්තුවක් ලබා දෙයි. දෙවියන් වහන්සේ දඬුවම් දෙන්නා සේම සමාව දෙන්නට ද සූදානම් දෙවිකෙනෙකු බව මීකා එළිදරව් කරයි.

- ඉහත ඡේදයට අනුව මීකා දිවැසිවරයා දේශනා කර ඇත්තේ කුමක් පිළිබඳව ද?
  ..........................................................................................................................................

- මීකා සඳහන් කළ සාම යුගයේ සිදු වන පරිවර්තනයන් කුමක් ද? (මීකා 4:1-3)
  ..........................................................................................................................................
  ..........................................................................................................................................
  ..........................................................................................................................................

  ➢ **මීකා 4:4-5 කියවා පිළිතුරු ලියන්න**

- යුද්ධයත් තරඟකාරීත්වයත් නැති කල සමාජයේ සිදුවන්නේ කුමක් ද?
  ..........................................................................................................................................

- 'මිදි වැල හා අත්තික්කා ගස යට යෙහෙන් වාසය කිරීම'යනුවෙන් අර්ථවත් වන්නේ කුමක් ද? ඔබගේ වචනයෙන් ලියන්න.
  ..........................................................................................................................................
  ..........................................................................................................................................

**දෙවියන් වහන්සේ පොරොන්දු වූ පරිදි ලෝකයාට සාමය හා ප්‍රේමය වැපිරීමට ක්‍රිස්තුස් වහන්සේ එවීම පිළිබඳව දෙවියන් වහන්සේට ස්තූති කරමින් අන් අයට සාමය හා ප්‍රීතිය ගෙන යන්නෙක් බවට ඔබව පත් කරන මෙන් ඉල්ලමින් දෙවියන් වහන්සේට යාච්ඤා කරන්න.**





## 9 වන ශ්‍රේණිය - 27 වෙනි පාඩම

# තරුණ සේවක තිමෝති

**බයිබල් කොටස : 1 තිමෝති 1: 18 - 19, 2 තිමෝති 2: 3-5**

**කටපාඩම් පදය: ' ඔබගේ තරුණකම නිසා ඔබ සුළු කොට සැලකීමට කිසිවෙකුට ඉඩ නොදෙන්න. ඔබේ කතාවෙන් ද හැසිරීමෙන් ද ප්‍රේමයෙන් ද ඇදහිල්ලෙන් හා පිරිසිදුකමින් ද අදහන්නන්ට ආදර්ශයක් වන්න. මා එන තුරු ප්‍රසිද්ධියේ ශුද්ධ ලියවිලි කියවීමට දඅනුශාසනා කිරීමට ද ඉගැන්වීමට ද අවධානය යොමු කරන්න.'**

**(1 තිමෝති 4 : 12-13)**

- දේව සේවයේ යෙදීම සඳහා පාවුල් තුමා තිමෝතිට ලබා දුන් වගකීම් 3 කවරේ ද?

……………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………

- 2 තිමෝති 2:3 න් කියවෙන පරිදි තිමෝති ක්‍රිස්තුස් වහන්සේට සේවය කිරීමට සූදානම් විය යුත්තේ කෙසේ ද?

……………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………

- පාවුලු තුමා (2 තිමෝති 2: 3-5) යොදාගන්නා රූප මගින් කියවෙන්නේ කුමක් ද?

**භේවායා**

……………………………………………………………………………………………………………

**ක්‍රීඩකයා**

……………………………………………………………………………………………………………

❖ ශක්තිමත් ඇදහිල්ලකින් සිටිමින්, එය බිඳී යෑමට ඉඩ නොදෙමින් එදිනෙදා ජීවිතයේ කටයුතු කරන්න.

❖ තරුණ තිමෝති පිළිබඳ වැඩි තොරතුරු බයිබලයෙන් සොයා කියවන්න. තිමෝති දේව සේවය වෙනුවෙන් තම තරුණ ජීවිතය කැප කිරීම හා ඔහුගේ ජීවිතයෙන් ඔබ ලබා ගත් ආදර්ශ ඇතුළත් කරමින් බිත්ති පුවත්පතකට ලිපියක් ලියන්න.

**දෙවියන් වහන්සේට නිර්මල හෘද සාක්ෂියක් සහිතව සේවය කිරීමට හැකියාව ලබා දෙන මෙන් ඉල්ලා යාච්ඤා කරන්න**

**සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය**



**9 වෙනි ශ්‍රේණිය - 28 වෙනි පාඩම**

# සේවක සෙල්වරත්නම්

**කටපාඩම් පදය: ''සියල්ලන් සමඟ සමාදානයෙන් සිටින්නටත් ශුද්ධකම නැතිව කිසිවෙක් සමිඳාණන් වහන්සේ නොදක්නා බැවින් ශුද්ධකම අනුව යන්නත් උත්සහ කරන්න.'' (හෙබ්‍රෙව් 12 : 14)**

## හැඳින්වීම

මෙතුමා නමින් සුබ්‍රමනියන් සෙල්වරත්නම්ය පසුකාලීනව සේවක සෙල්වරත්නම් සහෝදර තුමා යන නමින් ප්‍රසිද්ධියට පත් විය. ඉන්දියාවේ සෙරම්පුර් දේව ධර්ම විද්‍යාලයට ඇතුළත්ව දේව ධර්ම උපාධිය හැදෑරූ එතුමා ලංකාවට පැමිණ ලංකා සභාවේ (ඇන්ග්ලිකානු සභාවේ) දේව සේවකයෙකු ලෙස යාපනයේ අවුරුදු 8 ක් සේවය කළේය. එහිදී එතුමාගේ අරමුණ වූයේ ඉන්දියාවේ පැවති ක්‍රිස්තියානි ආශ්‍රම මෙන් ලංකාවේ ද ආශ්‍රම ආරම්භ කිරීමය. එතුමා ඉන්දියාවේ ආශ්‍රමවලින් ලද මූලික ආභාෂය වූයේ චාම් ජීවන ශෛලියයි. එතුමා එය මනුෂ්‍යයන්ගේ ආධ්‍යාත්මික වර්ධනයට යෙදවීමට කටයුතු කළේය.

1939 දී චුන්නාක්කම් අසල බිම් පෙදෙසක ආශ්‍රමයක් පිහිටුවිය. එහි නමස්කාරයට මුල් තැන දෙමින්, පෙරදිග වත් පිළිවෙත් අනුව දේව මෙහෙයන් පවත්වනු ලැබිණි. දිවයිනේ බොහෝ පළාත්වල කිතුනුවෝ එහි පැමිණ භාවනාවේ හා යාච්ඤාවේ නිරත විය. පසුකාලීනව ක්‍රිස්තු සේවා ආශ්‍රම් නමින් හැඳින් වූ මෙම ස්ථානය දුගී දුප්පත් ජනතාවට රැකවරණය ලබා දෙන සේවා ස්ථානයක් බවට පත්විය.

**සේවක සෙල්වරත්නම් තුමාගේ මෙහෙවර**

- **1939 චුන්නාක්කම් පිහිටවූ ක්‍රිස්තු සේවා ආශ්‍රමය සහ 1958 දී මඩකළපුවේ කිරාම් නම් ස්ථානයේ තවත් ආශ්‍රමයක් පිහිටුවීම.**
- **දුප්පත් පිරිමි දරුවන්ට ආශ්‍රමයේ නැවතී සිට පාසල් යාමට අවස්ථාව සලසා දීම.**
- **එම දරුවන්ගේ වියහියදම් එතුමා විසින් දරනු ලැබීම.**
- **ක්ෂය රෝගීන් සඳහා වූ රෝහලට ද වැඩිහිටි නිවාසවලට ද ගොස් දුබල අයට උපස්ථානය කිරීම.**

ආශ්‍රම පිහිටුවීමේ පුරෝගාමී දේව සේවකයා ලෙස සේවක සෙල්වරත්නම්ගේ සේවය අගය කළ හැකිය. සේවක සෙල්වරත්නම්ගේ චාම් ජීවන ශෛලීය පිරිසිදු චරිතය හා මහත් කැපවීමකින් ඉටු කළ සේවය නිසා ලෝක සභා සමුළු කිහිපයකම නමස්කාර කටයුතු මෙහෙයවීම එතුමාට භාරවිය.

කෙතරම් දුක් කරදර තිබුණත් 1973 දී මියයන තුරුම දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමින් ප්‍රීතිමත් ස්වභාවයෙන් කල් ගෙවීම එතුමාගේ ජීවිතයේ කැපී පෙනුණු ලක්ෂණයක් විය.



- මෙසේ අපි ද එකිනෙකාගේ ජීවිත ගොඩනැංවීම උදෙසා අපගේ ජීවිත වැය කරමින් සරල චාම් දිවි පෙවෙතක් ගත කර, ස්වඋත්සහයෙන් නැගී සිටීමට එකිනෙකාට උපකාර කර ගනිමු.

- සේවක සෙල්වරත්නම් තුමාගේ ජීවිතය ආදර්ශයට ගෙන පීඩාවට පත් ඔබගේ මිතුරෙකු හෝ උපකාර අවශ්‍ය වෙනත් දරුවෙකු වෙනුවෙන් කිතුනු දරුවෙක් ලෙස ඔබට කළ හැකි උපකාර ලියන්න.

**අභියෝග මැද වුව ද එකිනෙකාට උපකාර කිරීමට හැකියාව ලබා දෙන මෙන් ඉල්ලා යාච්ඤා කරන්න.**

9 වෙනි ශ්‍රේණිය - 29 වෙනි පාඩම

# ‘ඩෙෆ් ලින්ක්’ විශේෂ අවශ්‍යතා ඇති දරුවන් වෙනුවෙන් කැප වූ දයාවේ ආයතනය

**බයිබල් කොටස : ජොහාන් 3 :16 - 18**

**කටපාඩම් පදය : '' බිහිරි කෙනෙකුට සාප නොකළ යුතුය. අන්ධ කෙනෙකු යන මඟ හරහා අවහිරයක් නොතැබිය යුතුය. නුඹලාගේ දෙවියන් වහන්සේට ගරුබිය පෑ යුතුය. මම සමිදාණන් වහන්සේ වෙමි.**

**(ලෙවී කතා 19:14)**

## හැඳින්වීම

‘ඩෙෆ් ලින්ක් ’ යනු ශ්‍රී ලංකාවේ මෙතෝදිස්ත සභාව විසින් දියත් කරනු ලබන රාජ්‍ය නොවන ක්‍රිස්තියානි සංවිධානයකි. විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ට ඔවුන්ගේ ජීවන තත්වය වැඩි දියුණු කිරීමට, සාමාන්‍ය පහසුකම් සැලසීම සහ සමාන අයිතිවාසිකම් ලබා දෙන්න උදව් කරන ආයතනයකි.

මෙම ආයතනය දැනට වසර 19 කට වඩා කාලයක් මේ රටට තම සේවය සපයයි. 2000 වර්ෂයේ දී මෙතොදිස්ත සභාව විසින් සාමුවෙල් ඥානරාජා දේවගැති තුමාව ඩෙෆ් ලින්ක් ’ සේවය සඳහාම නිදහස් කර තිබේ. ප්‍රථම මධ්‍යස්ථාන ලෙස කල්මුනේ හා පොතුවිල් දිවා සුරැකුම් මධ්‍යස්ථාන හැඳින්විය හැකිය. රජය විසින් ඔවන්ගේ අධ්‍යාපනික ආයතන 16 ක් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට භාර ගෙන තිබීම ඉතාම සතුටුදායක තත්වයක් වේ.

**‘ඩෙෆ් ලින්ක් ආයතනයේ ප්‍රධාන අරමුණ:-**

පවුල් මධ්‍යස්ථාන හරහා ධනාත්මක රූපයක් ලබා දෙමින්, ඔවුන්ගේ සංස්කෘතික ප්‍රජාව සංවර්ධනය කිරීම.

**‘ඩෙෆ් ලින්ක් ආයතනයේ මෙහෙවර**

ළමුන්ට මුල් කාලීන මැදිහත්වීමේ වැඩසටහන්, නිපුණතා පුහුණුව, ස්වයං රැකියා ව්‍යාපෘති, උපදේශන සහ ආත්මික මඟ පෙන්වීම් සන්නිවේදනය කිරීම.

**‘ඩෙෆ් ලින්ක් ආයතනය අවධානය යොමු කර ඇත්තේ**

විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ට අර්ථවත් ජීවිතයක් ලබා දී ඔවුන් ජීවත් වන තත්වයන් වෙනස් කර, සමාජය තුළ ඔවුන් පිළිගැනීමට ලක් කිරීමයි.

**‘ඩෙෆ් ලින්ක් ආයතනය පහත සඳහන් කරුණු 4 කෙරේ විශේෂ ලෙස වැඩසටහන් වෙන්ව පවතියි.**

1. අධ්‍යාපනය
2. වෘත්තිමය

3. බලගැන්වීම
4. විනෝදාස්වාදය

- ඩෙෆ් ලින්ක් ආයතනය පිළිබඳව හෝ වෙනත් ක්‍රිස්තියානි සංවිධානයක් පිළිබඳව වැඩි විස්තර සොයා එහි මෙහෙවර අගයමින් සඟරා ලිපියක් ලියන්න.

➢ **කිතුනු දරුවකු ලෙස ඔබට විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් දෙස යහපත් දැක්මකින් බැලිය හැකි ද?**

❖ දයානුනුකම්පාව සමඟ ඔබගේ ආදරය ලබා දෙන්න.

❖ පිළිගැන්ම සමඟ මිත්‍රත්වයේ දෑත් දිගු කරන්න

❖ සීමාවන්ට පෙර හැකියාවන් දකින්න

➢ **ඔබට ඔවුන් වෙනුවෙන් කළ හැකි දේවල් පෙළගස්වන්න**

➢ **වෙනස්කම් ඇතිව උපත ලැබු හැකියාවන් ඇති පුද්ගලයන්ට උපකාර කිරීමටත් ඔවුන්ට වඩවඩා ප්‍රේම කිරීමටත් හැකියාව ලබා දෙන ලෙස ඉල්ලා යාච්ඤා කරන්න.**



**9 වන ශ්‍රේණිය - 30 වන පාඩම**

**අරමුණු ප්‍රවර්ධන පාඩම**

# පවුලක් ලෙස දෙවිදුන් යදිමු



**කටපාඩම් පදය: ‘‘ මන්ද, යම් තැනක දෙදෙනෙක් හෝ තුන් දෙනෙක් හෝ මාගේ නාමයෙන් රැස්ව සිටිත් ද එතැන ඔවුන් මැද මමත් වැඩ සිටිමි.**

**(මතෙව් 18:20)**

**අරමුණ:**

- පවුලේ යාච්ඤාවේ වැදගත්කම තේරුම් ගෙන සෑම නිවසකම පවුල් යාච්ඤාව පැවැත්වීම.
- පවුල් යාච්ඤාව තුළ පවුලේ අයගේ සම්බන්ධතාවය ගොඩනගා ගැනීම.

**යාච්ඤාව සඳහා සූදානම් වීම**



1. පවුලේ සැමට පහසු වෙලාවක් වෙන්කර ගැනීම (උදෑසන හෝ සවස් යාමය)
2. විශේෂ ස්ථානයකදී යාච්ඤා කිරීමට හුරුවීම.
3. පවුලේ සියලු දෙනා එක්ව යාච්ඤා කිරීම වැදගත් වුව ද, එක් අයකු හෝ සහභාගි වීමට අකමැතිනම් නැතිනම් පවුලේ සාමාජිකයෙක් වෙනත් ආගමක් අදහයි නම් ඔහුට හෝ ඇයට කිසිසේත්ම බල කිරීමක් නොකළ යුතුය.
4. කෙටි ගීතිකා බයිබල් කොටසක් හා යාච්ඤා කාලයක් පැවැත්වීමෙන් මෙම වෙලාව වඩා අර්ථවත් කර ගත හැකිය.
5. පවුල් යාච්ඤා කාලය නොකඩවා පැවැත්වීමට උත්සහා කරන්න.



- ඔබගේ එකම යාච්ඤාව නිතරම ඇසීමෙන් දෙවියන් වහන්සේ වෙහෙසට පත්වන බව නොසිතන්න.
- අප යාච්ඤා කරන විට අපගේ ඇදහිල්ල වර්ධනය වේ අප කරන ඉල්ලීම වෙනුවෙන් දෙවියන් වහන්සේගේ හස්තය වලනය වන බව ඔබට පෙනේ.

- ඔබ ඔබගේ පවුල වෙනුවෙන් යාච්ඤා කරනවා ද? ඔබගේ පවුලේ අය යාච්ඤාව සඳහා සහභාගි වෙනවා ද? එසේ නොවෙ නම් ඔවුන්ව සහභාගි කරවාගන්න.
- ඔබගේ පවුල වෙනුවෙන් දෙවියන් වහන්සේගෙන් ඉල්ලන්නේ කුමක් ද?

**පවුලේ සියලු දෙනා අතර සහසම්බන්ධතාවය වැඩිකරමින් පවුලේ යාච්ඤාව නොකඩවා කිරීමටත් දෙවියන් වහන්සේ හා සමග ඇදහිල්ල වර්ධනය කරගැනීමට උපකාර ඉල්ලමින් යාච්ඤා කරන්න.**

**සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය**